# හිතුවක්කාර ලියෝට පාඩමක්



සනූති නිහංසා කුමාරි මාන්නප්පෙරුම

# හිතුවක්කාර ලියෝට පාඩමක්

සනුති නිහංසා කුමාරි මාන්නප්පෙරුම

කතෘ ප්‍රකාශනයක්

2023 . 11. 15

# පිදුම

මෙලොවට දායාද කළ

ආදරණීය දෙමාපියන්ට

නිර්මාණශීලී, ගුණගරුක, සමාජයට වැඩදායී

හොඳ පුරවැසියන් බිහිකිරීමට වෙර දරණ

සියලුම ගුරු මෑණිවරුන්ට

සියලුම ගුරු පියවරුන්ට

මෙම පොත් පිංචය

සෙනෙහසින් පුද කර සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු, සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම් යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය සමග එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමි.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20



චතුමි කියන්නේ පුංචි සුරංගනාවියක් වගේ ලස්සන අහිංසක දැරියක්. හැබැයි ටිකක් දගකාරයි. ඒත් චතුමි මල්වලට, සමනලුන්ට, කුරුල්ලන්ට ගොඩාක් ආදරෙයි. එයා ආසාවෙන් මල් පැළ හදනවා. ඒ මල්වල පැණි බොන්න සමනල්ලු, පැණි කුරුල්ලෝ, මී මැස්සෝ නිතරම එනවා. උන් දිහා බලලා චතුමි සතුටු වුණා.



චතුමි එයාගේ අප්පච්චිට කියලා ගෙවත්තේ කුරුලු ලෑල්ලක් හදා ගත්තා. චතුමි වගේම එයාගේ පවුලේ අයත් පුලුවන් හැම වෙලාවකම කුරුල්ලන්ට ලේන්නුන්ට කන්න කුරුලු ලෑල්ලට කෑම දැම්මා.

චතුමිට හිටියා චතුමි වගේම ටිකක් දඟකාර කළුම කළු පූස් පැටියෙක්. උගේ නම ලියෝ. ලියෝ චතුමිගේ මල් වත්තට එන සතුන්ට වගේම කුරුලු ලෑල්ලට එන සත්තු හැංගිලා ඉඳලා අල්ලන්න පුරුදුවෙලා හිටියා. උන්ට කරදර හිරිහැර කළා. ඒක උගේ විනෝදාංශයක් වුණා.



ලියෝ නිතරම වත්තට එන සත්තුන්ට කරදර කරන එකට චතුම් ගොඩාක් දුක් වුණා. ඒත් එයා ඌට තියන ආදරේ නිසාම ඌට දඩුවම් කළේ නෑ.



ඊත් ලියෝ හැංගිලා සතුන්ට කුරුමානම් අල්ලනවා දකින හැම වේලාවෙම චතුම් ලියෝව ඈතට එලෙව්වා.



චතුමි නිතරම ලියෝව වඩාගෙන උගේ ඇග පිරිමැදලා "අනේ ලියෝ ඔයා මගේ හොඳ පූස් පැටියනේ. ඔයා වත්තට එන අහිංසක සත්තුන්ට කරදර කරන්න එපා" කියලා කීවා. ලියොත් ඒ වෙලාවට ආය එහෙම කරන්නෑ කියලා පොරොන්දු වුණා වගේ පුරු පුරු ගාමින් ගුලිවෙලා නිදාගත්තා.



ඒත් පූස් පැටියාට සත්තු දකිද්දී පොරොන්දුව අමතක වෙනවා. සත්තු දැක්කාම කටට කෙල උනනවා. ඉතිං ලියෝ ආයේ සත්තු අල්ලනවා. ලියෝගේ මේ නපුරුකම සතුන්ට කරදරයක් වුණා.



ලියෝගෙන් සතුන්ට වෙන මේ කරදර මීමැස්සෝ හැමදාම දැක්කා. මී මැසි රැජිණ අනික් මීමැස්සන් කැදවලා මෙහෙම කීවා. “අපි මුලින්ම ලියෝට කියලා බලමු සත්තුන්ට කරදර කරන්න එපා කියලා” .



පසුදා වෙනදා වගේම ලියෝ වත්තට ආපු සතුන්ට කරදර කළා. මේ වෙලාවේ මී මැසි රැජිණ ලියෝට කීවා “මේ වත්තට එන අනික් අහිංසක සතුන්ට කරදර කරන්න එපා” කියලා. ඒත් ලියෝ ඒ ඉල්ලීමට කීකරු නොවී දිගටම සතුන්ට කරදර කළා.



මේ වෙලාවේ මී මැස්සෝ රංචුවම ඇවිත් ලියෝට පන්න පන්නා විදින්න පටන් ගත්තා. ලියෝ වේදනාවෙන් කෑගහගෙන වත්ත පුරාම එහෙ මෙහෙ දුවමින් හැංගෙන්න තැනක් හෙව්වා. අවසානේ ගෙදරටම දිව්වා.



චතුමි ඉස්කෝලේ අවසන්වී ගෙදර ඇවිත් කාමරයට යද්දිම ඇඳයට හැංගිලා හිටපු ලියෝ එළියට ආවා. චතුමි එකපාරටම බය වුණා. මීමැස්සෝ විදපු නිසා ලියෝ අඳුනාගන්න බැරි තරමට ඉදිමිලා හිටියා. චතුමිට ගොඩාක් දුක හිතුණා.



චතුමි ලියෝව වඩාගෙන මෙහෙම කීවා. “ඔයාට ගොඩාක් රිදෙනවද ලියෝ? පේනවද ඔයා අනික් සත්තුන්ට හැමදාම කරදර කරනවා. එයාලට කොච්චර රිදෙනවා ඇද්ද? ඔයා අද ඉදං කිසිම සතෙක්ට කරදර කරන්න එපා” ලියෝ චතුමිගේ කතාව ඉවර වෙද්දිම ඊට එකඟවෙනවා සේ වේදනාවෙන් ඤාවි කීවා.



එදායින් පස්සේ නම් ලියෝ වත්තට එන සතුන්ට කරදර කළේ නෑ. පේනවා නේද පුංචි යාළුවනේ අපි අනික් අයට හිරිහැර කරලා සතුටු වෙන්න හොඳනෑ. ඉතිං අපිත් අනික් අයට කරදර නොකර හැමෝම එක්ක සතුටින් ජීවත් වෙන්න ඕනා එතකොට මුළු ලෝකෙම ලස්සන වෙනවා.



සමාප්තයි .

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ත සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

